# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
## அரச கணக்குகள் திணைக்களம்
## Department of State Accounts


| මගේ අංකය / எனது இல. / My No. | SA/ST/CI/15-ii/2012 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2012.10.22 |
|---|---|---|---|---|---|

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ-අංක 225/2012
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
ආයතන ප්‍රධානීන් හා,
දිස්ත්‍රික් ලේකම්වරුන්.

<u>රජයේ වැටුප් පිළියෙල කරන වැඩසටහනින් (GPS) කරනු ලබන වැටුප් අවකරණයන් සීමා කිරීම</u>

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සම්පත් දායකත්වයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වගකීම යටතේ නිකුත් කරනු ලැබූ දැනට රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත්සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා විසින් වැටුප් පිළියෙල කිරීමට භාවිතා කරනු ලබන GPS (Government Payroll System) වැඩසටහන සම්බන්ධව කාරුණික අවධානය යොමු කරමි.

2.එම වැඩසටහන භාවිතයෙන් වැටුප් පිළියෙල කිරීමේදී අනුගමනය කල යුතු පාලනයන් 2004/05/04 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 7/2004, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව නිකුත්කල 2010-02-19 දිනැති DMA/2004(4) දරණ චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 238 සඳහන් කර ඇත.

3. චක්‍රලේඛ සහ මුදල් රෙගුලාසි මගින් මෙම වැඩසටහනට අදාල අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දී ඇතත් පවුලේ සාමාජිකයන්ට හෝ වෙනත් අයට අවකරණ යැවීම සඳහා භාවිතා කරන Remittance to Relation යන වරණය යම් යම් අවස්ථා වලදී අවභාවිතා කිරීමෙන් වැටුප් වංචනිකව පිළියෙල කර එම මුදල් වෙනත් පාර්ශවයන්ට යැවීමට කටයුතු කර ඇති බව දැනගැනීමට ලැබී ඇත. එම නිසා නීතිමය වශයෙන් අත්‍යවශ්‍ය වන නඩත්තු නඩුවක යැපෙන්නන්ට කරනු ලබන ගෙවීම, රාජකාරියේ යෙදී සිටියදී මිය ගිය නිලධාරියෙකුගේ වැටුප් පවුලේ සාමාජිකයන්ට ප්‍රේෂණය කිරීම වැනි අධිකරණ නියෝගයකින් හෝ චක්‍රලේඛයකින් ආවරණය වන අවකරණයන් පමණක් GPS වැඩසටහනේ Remittance to Relation යන පහසුකම භාවිතා කර සිදුකල යුතුබව අවධාරණය කරමි.

4.උක්ත උපදෙස්වලට අනුකූල නොවන ආකාරයට යම් ආයතනයක GPS වැඩසටහන භාවිතා කිරීමෙන් සිදුකරණ අවකරණයන් නිසා සිදුවන අලාභහානි සම්බන්ධයෙන් එම අවකරණයන් සිදු කරන නිලධාරීන්ට වගකීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න. මේ සම්බන්ධව යම් උපදෙසක් අවශ්‍ය වන්නේ නම් මෙම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්ලිව්.කේ.එස්.ද.අල්විස් මහතාගේ දුරකථන අංකය :011-2484730 ඇමතීමට කටයුතු කරන්න.

ඒන්.ජී.දයාරත්න

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : විගණකාධිපති


මහ භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka. General - Tel.: +94 112 484600 Website: www.sad.gov.lk
Director General - Tel.: +94 112 484728 Fax: +94 112 473856 e-mail: dgsa@sad.treasury.gov.lk Additional Director General - Tel.: +94 112 484898
Director (Accounting & Reporting): +94 112 484747 Director (Accounting Services): +94 112 484753 Director (Systems & Training): +94 112 484733